**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව - 2021**

**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**--------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

**-------------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ

වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දේපළ පිරියත හා උපකරණ රු.310,687,237 ක් තොගය රු.573,443 ක් ලැබිය යුතු ශේෂ රු.87,456,375 ක් සේවක ණය හා අත්තිකාරම් රු.5,399,117 ක් ආයෝජන රු.10,762,983 ක් පෙර ගෙවුම් රු.168,541 ක් සහ මුදල් හා මුදල් සමාන දෑ රු.25,618,341 ක් වශයෙන් මුළු වත්කම් වල වටිනාකම රු.440,666,037 ක් වූ අතර සමුච්චිත අරමුදල රු.80,139,045 ක් ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීම රු.309,948,597 ක් හා ජංගම වගකීම් රු.48,086,649 ක් වශයෙන් මුළු හිමිකම් හා වගකීම්වල වටිනාකම රු.438,174,291 ක් වූයෙන් රු.2,491,746 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2022 වර්ෂය සඳහා පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශනයෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු විවිධ වියදම් රු.301,952 ක් වෙනුවෙන් විවිධ ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලස්වා නොතිබුණි. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී සභාව සතු දේපළ වැඩි දියුණු කිරීම සඳහා දරන ලද රු.3,692,636 ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2022 වර්ෂය සඳහා පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශනයෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | ඉකුත් වර්ෂයේ රු.459,304 ක ණයගැති ප්‍රතිපාදන සලස්වා තිබූ වෙළෙඳගොඩ ලුණුගොඩ පාර පැතිබැම්ම ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තයට අදාලව ලැබී තිබූ රු.291,115 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂවලට අදාලව නිරවුල් කරන ලද කර්මාන්ත ණයහිමියන් රු.781,087 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි . | | |
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසානයට රජගෙවත්ත ලෙනාඩ් මහතාගේ නිවස අසල බෝක්කුව ඉදිකිරීම වෙනුවෙන් ගෙවිය යුතු රු.224,249 ක් සඳහා කර්මාන්ත ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලස්වා නොතිබුණි. | | |
| (උ) | සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැඟිලි වටිනාකම යාවත්කාලීනව තක්සේරු කර හා දේපළ සංවර්ධනය කිරීම සඳහා වැය කර තිබූ රු.3,378,526 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | | |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.99,019,782 ක් වූ ගිණුම් විෂයයන් 12 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛන හා ලෙජර් ගිණුම්වල දැක්වෙන ශේෂ අතර, එකතුව රු. 834,685 ක අසමානතා පැවතුණි. | ඉදිරි වර්ෂවලදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙවැනි දෝෂ සිදු නොවීමට කටයුතු කරන බව. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු.9,740,481 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.1,822,688 ක් විය.

### 2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

#### (අ) වරිපනම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ වරිපනම් ඒකක 421 ක් පැවති අතර වර්ෂය අවසානයට වරිපනම් ඒකක 161 කින් රු.165,848 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ශේෂයන් අයකර ගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකළ යුතුය. |

#### (ආ) කඩකුලී

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට සභාව සතු කඩ කාමර 42 ක් බදු දී තිබූ අතර කඩ කාමර 29 කින් රු.726,940 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ශේෂය අයකර ගැනීම සඳහා කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 - 2021 අතර කාලපරිච්ඡේදය තුළ සභාවට ඉදිරිපත් කරන ලද ගොඩනැඟිලි අයදුම්පත් 06 ක් විවිධ හේතූන් මත අනුමත කර නොතිබුණද ක්ෂේත්‍ර නියැදි විගණන පරික්ෂාවේදී එම ගොඩනැඟිලි ඉදිකර තිබුණි. තවද නාගරික බල ප්‍රදේශයේ සංවර්ධන බලපත්‍ර ලබා ගැනීමකින් තොරව ගොඩනැඟිලි 07 ක් ඉදිකර තිබූ අතර මෙම අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/ රෙගුලාසි ඇතුළත් 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් නිවේදනයේ 02 වන උපලේඛනය ප්‍රකාරව කටයුතු කර රු.1,927,376 ක ගාස්තු අය කර ඉදිකිරීම් විධිමත් කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය. | අයදුම්කරුවන් දැනුවත් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේ සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන හා සමාලෝචිත වර්ෂයේ සභා අරමුදල් යටතේ ක්‍රියාත්මක කර තිබූ කොන්ක්‍රීට් කාණු සැකසීමේ කර්මාන්තයක් හා පැති බැම් ඉදිකිරීමේ කර්මාන්ත 05 කට අදාලව පදම් කළ ලෑලි (Plywood) පුවරු භාවිතා කර හැඩයම් සැකසීම සඳහා ගෙවීම් කිරීමේදී සමාන වැඩ විස්තරයක් සහිත රේටයක් ලෙස දකුණු පළාත් ඉංජිනේරු සේවා කාර්යාලය විසින් CT- 036 යටතේ හඳුන්වා දුන් රු.841 ක රේටය වෙනුවට, දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අඟල් 01 (55 mm) ඝනකමට ඉරන ලද දෙවන පන්තියේ දැව ලෑලි භාවිතා කර හැඩයම් සැකසීම සඳහා ST – 057 යටතේ හඳුන්වා දී තිබූ රු. 1,108 රේටය භාවිතා කිරීම නිසා වර්ග මීටරයකට රු.267 බැගින් වර්ගමීටර් 592.83 ක් සඳහා රු.158,285 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | 2020 සපිරි ගමක් ප්‍රජා පාදක ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ මාර්ග ඇස්තමේන්තු සකස් කිරීමේදී යොදා ගනු ලැබුවේ දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද මිල ගණන් බව. | සුදුසු හා වාසිදායක රේටයන් භාවිතා කළ යුතුය. |
| (ආ) | 2020 වර්ෂයේ සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබූ ගල්පමුණ ආදම්වත්ත මාර්ගය රංජි මහතාගේ නිවස අසල සිට කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාලව ඉදිකළ මාර්ගයේ දිග මීටර් 178 ක් හා පළල මීටර් 2.4 ක් ලෙස මිනුම් පත්‍රයේ ඇතුළත්කර තිබූ නමුත් ඉදි කර තිබූ මාර්ගයේ මුළු දිග මීටර් 161.7 ක් වූ බැවින් මීටර් 16.7 ක් සඳහා කොන්ක්‍රීට් ඝන මීටර් 5.01 ක් වෙනුවෙන් රු.86,312 ක මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි. | ඉදිරියේදී මෙවැනි අතපසු වීම් නොවන ආකාරයට කටයුතු කරන බව. | ඉටු කළ වැඩ සඳහා පමණක් ගෙවීම් කළ යුතුය. |